# බුද්ධ ධර්මය

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

## 1.0 හැඳින්වීම

ශ්‍රී සම්බුද්ධ ධර්මය සෘජුවම ජීවිතයට ප්‍රායෝගිකව එක් වූ විෂයයකි. ප්‍රායෝගිකත්වයෙන් තොර බුදුදහමක් කිසිසේත් ප්‍රයෝජනයක් නොමැති බව බුදුරදුන් දැඩි ලෙස අවධාරණය කර ඇත. ධර්මය ඇසීම, දැනුම ලබා ගැනීම සඳහා වූ සරළම අවස්ථාව වේ. එතෙකින් නොනැවතී ධර්මයඅනුව චින්තනය මෙහෙයවමින් ධර්මය ප්‍රත්‍යක්ෂයක් බවට පත්කර ගැනීම අත්‍යවශ්‍යයය.

ආගම් විෂයයනට පාසල් කාල සටහනෙහි වෙන්ව ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් පමණි. ඒ කාලය තුළ බුදු දහම දරුවන් තුළ ප්‍රායෝගිකරණය කිරීම භාරදූර කාර්යයක් වී ඇත. බොහෝ පාසල්හි බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා බුද්ධ ධර්ම විෂයය පුහුණු ගුරු භවතුන් නොමැත. ඉතා අපහසුවෙන් වෙනත් විෂය පුහුණු ගුරු භවතෙකුට විටෙක පැවරෙන බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම පූර්ණ දැනුමක් අත් කර ගැනීමට තරම්වත් සමත් වී නැත.

එබැවින් නව සහශ්‍රකයේ විෂයමාලා ප්‍රතිසංස්කරණය, ඉගෙනුම් බී ඉගැන්වීම් ක්‍රමවේදයන්හි පර්යේෂණාත්මක වෙනස, ආගම් විෂයය විද්‍යාර්ථීන් තුළට ජීවිත ප්‍රත්‍යක්ෂයක් වීම සඳහා වූ ප්‍රායෝගික ක්‍රියාකාරකමක් බවට පත් කිරීමට ඉඩ ලැබීම නව පියවරක් ලෙස සඳහන් කරමි. විශාල දැනුම් සම්භාරයක් හිමිකර දිය යුතුය යන ආකල්පයෙන් මෙතෙක් මේ විෂයය දෙස අවධානය යොමු කළ භවතුනට මේ නව ක්‍රමවේදය පිළිබඳ මතුපිට පරීක්ෂාවෙක දී ස්වකීය අදහස සනාථ නොවන බවක් දැක්මෙන් යම් විවාදාත්මක බවක් මතු වුව ද ගුරු පුහුණුව තුළ අදාළ ගුරු භවතුන් නොඅඩු විෂය දැනුමක් සහිතව සිසුන් මෙහෙයවිය යුතු ආකාරය පැහැදිළි කෙරෙනු ඇත.

ඒ අනුව බුද්ධ ධර්ම විෂයය ගවේෂණාත්මක ක්‍රියාකාරකමක් ලෙස පන්ති කාමරයට ප්‍රවේශවනු ඇත. සොයා යෑමේ සක්‍රිය ඉගෙනුමක් තුළ පෙරට වඩා ප්‍රත්‍යක්ෂකරණයක පෙරළියක් දරුවන් තුළ ගොඩ නැගී දහම අනුව දැහැමි වනු ඇතැයි අපේක්ෂිතය. සිසුන් තුළ සමබර පෞරුෂයක් ඇති කිරීමට බුද්ධ ධර්ම විෂය මෙහෙයවමින් එදිනෙදා ජීවිත අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි සිසු පරපුරක් බිහිකිරීමට ගවේෂණාත්මක ශක්තියක් ලබාදීම නව ක්‍රමවේදයෙහි සමාරම්භක අවස්ථාව වේ. ස්ව අධ්‍යාත්මීය සංවර්ධනය මෙන්ම සාමූහිකව කටයුතු කිරීමට හුරුකරමින් අධ්‍යාපනයෙහි සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීමට බුද්ධ චරිතය, බුද්ධ ධර්මය, ශාසන ඉතිහාසය, ආදී ක්ෂේත්‍ර තුළින් මතුකර ගත් නිපුණතා සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රමාණකර ඒ ඒ ශ්‍රේණීන් වෙත යොමු කර ඇත. හයවන ශ්‍රේණියේ සිට එකොළොස්වන ශ්‍රේණිය දක්වා එකම නිපුණතාවක් සාධනය කර ගැනීමට ඒ ඒ ශ්‍රේණිවලදී අදාළ නිපුණතාවයෙහි නිපුණතා මට්ටම් හඳුන්වා ÷ÀÛ à`õ. නිපුණතා මට්ටම සාධනය කර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකමක් සාමූහිකව ගවේෂණය කිරීමට යොමුවන ගුරු ශිෂ්‍ය දෙපිරිසම පන්ති කාමරයේ දී සක්‍රියව සහභාගිවෙමින් ධර්ම ප්‍රත්‍යක්ෂකරණයෙහි යම් සුභදායක නව ප්‍රවේශයක් ලබා ගනු ඇතැයි බුද්ධ ධර්ම විෂය තුළින් අපේක්ෂා කර සිටී.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2.0 විෂයට අදාළ නිපුණතා

- බුදුදහමට අනුව ජීවිතය හා ලෝකය හඳුනාගෙන ක්‍රියා කරයි.
- තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි.
- ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.
- බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි
- ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි
- බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳින එය රැක ගැනීමට ක්‍රියා කරයි.
- ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.
- බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.
- සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගනියි.
- නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයයේ ගමන් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3.0 ශ්‍රේණියට අදාල නිපුණතා මට්ටම

- බුදුදහමේ එන මූලික ඉගැන්වීම් පිළිබඳව නිරවුල් දැනුමක් ලබා ගනියි
- ජීවිතය හා ලෝකය වෙනස්වන බව දැන ඒ අනුව ක්‍රියා කරයි.
- මූලික බෞද්ධ ඉගැන්වීම් භාවිත කරමින් අර්ථවත් ජීවිතයක් ගොඩනගා ගනියි.
- විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පිළිගනියි.
- බුදුසිරිතේ ප්‍රධාන සිද්ධි විස්තර කරයි.
- බුදුසිරිතෙන් ආදර්ශ ගෙන තම ජීවිතය හැඩ ගසා ගනියි.
- තෙරුවන් ගුණ හැඳිනගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.
- දහම තමා විසින් අවබෝධ කර ගනිමින් ධර්ම අධ්‍යයනයේ යෙදෙයි.
- තම පෞරුෂය ගොඩනගා ගැනීමට සගගුණවලින් ආදර්ශ ලබයි.
- අවබෝධයෙන් යුතුව වන්දනාමාන හා වතාවත්වල යෙදෙයි.
- අර්ථවත්ව බෞද්ධ සිරිත්විරිත් අනුගමනය කරයි.
- භාවනාවේ වැදගත්කම සහ අවශ්‍යතාව තේරුම්ගෙන භාවනාවේ යෙදෙයි.
- ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් තම ජීවිතය හැඩගසා ගනියි.
- ධම්මපදයෙන් ආදර්ශ ගෙන ජීවන දර්ශනය හැඩගසා ගනියි.
- බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ජීවන රටාව ගොඩනගා ගනී.
- සමාජ සදාචාරය ගොඩ නැගීමට සිල්වත්වීමෙන් දායක වෙයි.
- සීලය පාදකකොට ගනිමින් අධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගනියි.
- බෞද්ධ සමාජ ධර්ම උපයෝගි කර ගනිමින් ධාර්මික සමාජ සබඳතා ගොඩ නගයි.
- තමා උපමාකොට ගෙන සියලු ජීවීන් කෙරෙහි හිතානුකම්පීව ක්‍රියා කරයි.
- අන්‍යෝන්‍ය ගෞරවය සුරැකෙන පරිදි මානව සබඳතා පවත්වයි.
- ස්වභාව සෞන්දර්ය ආස්වාදනය කරමින් පරිසර සංරක්ෂණයට දායක වෙයි.
- කායික මානසික සෞඛ්‍යය සුරැකෙන පරිදි  පරිසරය සකසා ගනියි.
- ශාසනය සුරක්ෂිත කිරීම සඳහා සංගායනාවලින් ගත් පියවර අධ්‍යයනය කොට අගය කරයි.
- මහින්දාගමනයේ දායාද හඳුනාගෙන ඒවා රක්ෂණයට හා පෝෂණයට දායක වෙයි
- ශ්‍රී ලාංකික ජන සංස්කෘතිය හදාරා එහි බෞද්ධ අනන්‍යතාව රැක ගැනීමට කටයුතු කරයි.
- සාමයෙන් සහ සහජීවනයෙන් ක්‍රියා කිරීමට බුදු සිරිතෙන් ආදර්ශ ගනියි.
- බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් මිනිසාගේ ඒකත්වය දකියි.
- බෞද්ධ  චින්තනයේ  එන රාජ්‍ය  පාලන මූලධර්ම අධ්‍යයනය කර භාවිත කරයි.
- ධනෝපායනය පරිභෝජනය හා රක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට  නගයි.
- පාලනය - ආර්ථිකය හා සදාචාරය අතර අන්‍යෝන්‍ය සම්බන්ධය හදාරයි.
- චින්තනය සහ විමංසනය පිළිබඳ බෞද්ධ ආකල්ප ප්‍රගුණ කරයි.
- වගකීමෙන් යුතුව නිවැරදි තීරණ ගනියි.
- ආරම්භක ශක්තියෙන් හා නිර්මාණශීලිත්වයෙන්  යුතුව උද්යෝගයෙන් ක්‍රියා කරයි.
- ඉවසා දරා ගැනීමේ ශක්තියෙන් යුතුව ලෝකස්වභාවයට මුහුණ දෙයි.
- වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතයක් ගොඩනගා ගැනීමට පෙළඹේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- බෞද්ධ ජීවිතය ශ්‍රද්ධාවෙන් ආරම්භ වන බව දැන සැදැහැතිව ක්‍රියා කරයි.
- නිවැරදි දැක්මක් ඇතිව කායික මානසික ක්‍රියාවන්හි යෙදෙයි.
- නිවන් අරමුණේ වැදගත්කම තේරුම් ගෙන බෞද්ධ ප්‍රතිපදාවේ නියැලෙයි.

## 4.0 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

බුදු දහමෙහි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයන්, ශාස්තෘ වූ බුදුරදුන් ජීවමාන වැඩ සිටියදීම විවිධාකාරයෙන් භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත්ව ලබාගත් අයුරු පැහැදිලිව දක්නට ඇත. මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසකින් යුත් කැපවීමක් ඉගෙනුම්ලාභීන් ද ප්‍රබෝධාත්මකව සක්‍රියවන අතර අධිකාරී මෙහෙයවීමකින් තොරව ශිෂ්‍ය කේන්ද්‍රීයත්වයට නිසැකවම පත්වනු ඇත.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදු විය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු-සිසු අන්තර් ක්‍රියා ද පසු ව අංගී වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයෙකුගේ තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හංකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව ලෙස නම් කර තිබේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර හෙවත් ප්‍රවේශය වශයෙන් හඳුන්වමු. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් නුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් වැනි උත්තේජක යොදා ගැනීම / ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය / දෙබස්, භූමිකා රංගන, කවි, ගීත,ගාථා ආදර්ශන සෘජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීමට ප්‍රවේශයක් ලබාගැනීම සඳහා පළමු පියවර ක්‍රියාත්මක විය යුතුය.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදවු වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේ.

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී කණ්ඩායම් ප්‍රමාණය ගුරුවරයා විසින් තීරණය කළද එම ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිරිනැමීම පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකී සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ තුන්වන පියවරේ දී සෑම කුඩා කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දී ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පැහැදිලි කිරීම හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම් වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට සෙසු කණ්ඩායම්වල සිසුන් ද යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනයෙහි වගකීම ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුකරණය හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ 2 පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් ගුරුවරයාට ඉඩ තිබේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දී කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

බුද්ධ ධර්මය විෂයය තුළ දහම අධ්‍යාත්මීකරණය කොට ඇහැම් ක්‍රියාකාරකම් සන්තතියක් සමස්ත ජීවිත උරුමයක් සේ උත්පාදනය කිරීම සඳහා මෙම නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය වඩාත් ඉවහල්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බුදුරදුන් විසින් රාහුල හිමියන්, චූල්ලපන්ථක හිමියන්, කිසාගෝතමියන් වෙත සදහම් ප්‍රත්‍යක්ෂය සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙයින් වසර දෙදහස් පන්සිය පනහකට පෙර ද භාවිතා කර ඇති අතර අරමුණ සාධනය සඳහා දේශන ආදි ක්‍රමවේදයන් ද උචිත අයුරින් යොදාගෙන ඇති බවද අමතක කළ නොහැක. මෙම ඉගනුම් ඉගැන්වීම් ක්‍රමවේදය තුළ සියල්ල අන්තර්ගතව ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

බුද්ධ ධර්ම විෂයය පාසලෙහි ඉගැන්වීමේ දී බුදු දහමේ සමස්ථ අර්ථ ක්‍රියාකාරිත්වය අමතක නොකොට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. පුද්ගල චරිත සංවර්ධනයත්, සමාජ සුසංයමයත් ගොඩ නැගෙන පරමාදර්ශී ඒකකය ලෙස බුද්ධ ධර්ම විෂය භාර ගුරු භවතුන් ක්‍රියා කළ යුතු වන අතර පාසල තුල දැහැමි බව අගයන නිරන්තර පැවැත්මක් සනාථ විය යුතුය. බෞද්ධ සංකේතයක් ලෙස බුදු මැදුරක් හෝ බුද්ධ ප්‍රතිමාවක් හෝ තිබීම මැනවැයි යෝජනා කරන අතරම බුද්ධ ධර්ම විෂයය ඉගැන්වීම සඳහා විෂය පන්ති කාමරයක් වෙන්ව තිබීම ද වඩාත් ඉහළ ආයෝජනයක් කරගත හැක. පන්ති කාමරයෙන් බැහැරව විෂය සමගාමී වූ බෞද්ධාගමික ක්‍රියාකාරකම් සැබෑ හැඟීමකින් ඉටු කෙරෙන නායකත්ව ආදර්ශයක් පාසල තුළ නිර්මාණය විය යුතුය. උදාහරණයක් ලෙස බෞද්ධ ආගමික වතාවත් කරන අවස්ථාවක එම අවස්ථාවේ ප්‍රධානියා ලෙස බෞද්ධ වතාවත් කරන අයෙකු පෙනී සිට නිවැරදි ඉරියව් පවත්වමින් සැමට ආදර්ශයක් සැපයිය යුතුය.

පාසලෙහි දෛනික ආරම්භය විවේකයෙන් පසු කාලච්ඡේදයේ ආරම්භය සහ දෛනික කටයුතු අවසන් අවස්ථාවන්ට ආගමික ක්‍රියාකාරකම් යොදා ගැනීමක්. මාසිකව, වාර්ෂික විශේෂ බෞද්ධ ආගමික ක්‍රියාකාරකම් ළමුන්ට මූලිකත්වය දෙමින් සැළසුම් කිරීමක් අවශ්‍ය ය.

- අධ්‍යාපන චාරිකා
- පර්යේෂණ ව්‍යාපෘති
- ඇනුම මිනුම, චිත්‍ර ප්‍රදර්ශන
- බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන
- ධර්ම දේශනා, භාවනා වැඩමුළු, පිරිත් පිංකම් , දාන පිරිනැමීම් ආදිය උදාහරණ ලෙස දැක්විය හැක.

මේ සියලු ක්‍රියාකාරකම් තුලින් මානව වර්ගයා වෙත පමණක් නොව සමස්ත විශ්වය වෙත සිද්ධකරනු ලබන අර්ථයක්, යහපතක් සහිත ඉගෙනුම්ලාභීන් පිරිසක් බිහි කිරීම ප්‍රතිපත්තිය කොට සැළසුම් සකස් කිරීම විශිෂ්ට ලෙස බුද්ධ ධර්ම විෂය පාසල තුළ ආයෝජනය කිරීමක් වනු ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.0 තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගංටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක ක්‍රියාකාරකම් දිශාභිමුඛ කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත් ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරංව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩ නැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මුලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට අංතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනිමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කර ගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

අතර සෑම ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක් වේ.

- සංකල්ප සිතියම්
- බිත්ති පුවත්පත්
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- ප්‍රශ්න සහ පිළිතුරු පොත්
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු
- සිසු නිර්මාණ ප්‍රදර්ශන
- විවාද
- සාකච්ඡා මණ්ඩල
- සම්මන්ත්‍රණ
- කල්පණික කථා
- භූමිකා රංගන
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම
- ක්ෂේත්‍ර පොත් / ස්වභාව අධ්‍යයන දින පොත් / හොඳ වැඩ පොත්
- ප්‍රායෝගික පරීක්ෂණ

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

7 .0

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 01. බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හඳුනාගෙන ක්‍රියා කරයි | 1.1 බුදු දහමේ එන මූලික ඉගැන්වීම පිළිබඳව නිරවුල් දැනුමක් ලබා ගනියි<br>1.2 ජීවිතය හා ලෝකය වෙනස්වන බව දැන ඒ අනුව ක්‍රියා කරයි.<br>1.3 මූලික බෞද්ධ ඉගැන්වීම භාවිත කරමින් අර්ථවත් ජීවිතයක් ගොඩ නගා ගනියි.<br>1.4 විශ්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පිළිගනියි. | හොඳ නරක නිර්නායක<br>1.2 ත්‍රිලක්ෂණය - වෙනස්වීමේ ධර්මතාව | දෙකයි<br>දෙකයි |
| 02. තෙරුවන් ගුණ හැඳින චරිතායනය කරයි | 2.1 බුදු සිරිතේ ප්‍රධාන සිද්ධි විස්තර කරයි.<br>2.2 බුදු සිරිතෙන් ආදර්ශ ගෙන තම ජීවිතය හැඩගසා ගනියි.<br>2.3 තෙරුවන් ගුණ හැඳිනගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.<br>2.4 දහම තමා විසින් අවබෝධකර ගනිමින් ධර්ම අධ්‍යයනයේ යෙදෙයි.<br>2.5තම පෞරුෂය ගොඩනගා ගැනීමට සගගුණවලින් ආදර්ශ ලබයි. | 2.1 උපතේ සිට දම්සක් සුතුර දෙසීම තෙක් බුදුසිරිත<br>2.1 බුදු සිරිතෙන් ශිෂ්‍ය ජීවිතයට<br>2.2විමර්ශනශීලීත්වය<br>2.3 බාධක ජයගෙන ඉදිරියට යාම<br>2.4 බුදුගුණ මහිම<br>2.5 බුදුරදුන්ගේ දිනචරියාව | දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි |
| 03 ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි. | 3.1 අවබෝධයෙන් යුතුව වන්දනාමාන හා වතාවත්වල යෙදෙයි.<br>3.2 අර්ථවත්ව බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කරයි.<br>3.3 භාවනාවේ වැදගත්කම හා අවශ්‍යතාව තේරුම්ගෙන භාවනාවේ යෙදෙයි.<br>3.4 ශ්‍රාවක ශ්‍රාවිකා චරිත ඇසුරින් තම ජීවිතය හැඩගසා ගනියි.<br>3.5 ධම්මපදයෙන් ආදර්ශ ගෙන ජීවන දර්ශනය හැඩගසා ගනියි. | 3.1 වන්දනා හා වතාවත්<br>3.2 භාවනාව සහ ඉරියව් හඳුනාගැනීම<br>3.3 චරිතකතා ඉගෙනීමේ අවශ්‍යතාව<br>3.4 රාහුල පොඩිහාමුදුරුවෝ<br>3.5 නහිවේරේන වේරානි<br>3.6 අක්කොච්ඡිමං බී<br>3.7 අත්ථස්සද්වාර ජාතකය | දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි<br>දෙකයි |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| 04 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිගනියි<br><br>05. ජීවී අජීවී පරිසරයට හිතකාමීව හැසිරෙයි<br><br>06. බෞද්ධ ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික උරුමය හැඳින එය රැකගැනීමට ක්‍රියා කරයි.<br><br>07. ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.<br><br>08. බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැදින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 3.6 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ජීවන රටාව ගොඩනගා ගනී<br><br>3.1 සමාජ සදාචාරය ගොඩ නැගීමට සිල්වත්වීමෙන් දායක වෙයි<br>3.2 සීලය පාදකකොට ගනිමින් ආධ්‍යාත්මික සංවර්ධනය ඇතිකර ගනියි<br>3.3 බෞද්ධ සමාජ ධර්ම උපයෝගිකර ගනිමින් ධාර්මික සමාජ සබඳතා ගොඩ නගයි<br>5.1 තමා උපමාකොට ගෙන සියලු ජීවීන් කෙරෙහි හිතානුකම්පීව ක්‍රියා කරයි.<br>5.2 අන්‍යෝන්‍ය ගෞරවය සුරැකෙන පරිදි මානව සබඳතා පවත්වයි.<br>5.3 ස්වභාව සෞන්දර්ය ආශ්වාදනය කරමින් පරිසර සංරක්ෂණයට දායක වෙයි.<br>5.4 කායික මානසික සෞඛ්‍යය සුරැකෙන පරිදි පරිසරය සකසා ගනියි.<br>6.1 ශාසනය සුරක්ෂිත කිරීම සඳහා සංගායනාවලි ගත් පියවර අධ්‍යයනය කොට අගය කරයි<br>6.2 මහින්දාගමනයේ දායාද හඳුනාගෙන ඒවා රක්ෂණයට හා පෝෂණයට දායක වෙයි.<br>7.1 ශ්‍රී ලාංකික ජන සංස්කෘතිය හදාරා එහි බෞද්ධ අනන්‍යතාව රැක ගැනීමට කටයු කරයි.<br>7.2 සාමයෙන් සහ සහජීවනයෙන් ක්‍රියා කිරීමට බුදු සිරිතෙන් ආදර්ශ ගනියි.<br>7.3 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් මිනිසාගේ ඒකත්වය දකියි.<br>8.1 බෞද්ධ චින්තනයේ එන රාජ්‍ය පාලන මූලධර්ම අධ්‍යයනය කර භාවිත කරයි.<br>8.2 ධනෝපායනය පරිභෝජනය හා රක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ක්‍රියාවට නගයි. | 4.1 සීලය හැඳින්වීම<br>4.2 ආයතිසංවරයෙහි පිහිටිය හැකි බව<br>4.3 මව්පිය දූදරු සබඳතා<br><br>5.1අත්තානං උපමං කත්වා<br>5.2සම්මානනය - අනවමානනය (පුතා,දුව, මව,පියා)<br>5.3පරිසර දූෂණයෙන් වැළකීම (ශබ්ද, වායු,ජල)<br>5.4අන්‍යෝන්‍ය ගෞරවය රැකෙන පරිදි වචන භාවිතය<br><br>6.1මහින්දාගමනය (එම කතා පුවත)<br>6.2දුමින්දාගමනය<br><br>7.1 ශ්‍රී ලාංකික අනන්‍යතාව<br>ජාතික කොඩිය<br>ජාතික ගීය<br>ජාතික පුෂ්පය<br>ජාතික වෘක්ෂය<br><br>8.2 සරළ දිවි පැවැත්ම අරපිරිමැස්ම - සීමිත පරිභෝජනය, කූල සූත්‍රය ඇසුරින්<br>8.3 ස්වර්ණ හංස ජාතකය ඇසුරින් දැඩි ලෝභය විනාශයට මූල බව<br><br>9.2වගකීම - සෝපක කථාව ඇසුරින් | දෙකයි<br>දෙකයි<br><br>දෙකයි<br><br>දෙකයි<br>දෙකයි<br><br>දෙකයි<br>දෙකයි<br><br>දෙකයි<br><br>දෙකයි<br><br>දෙකයි |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| 09. සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩ නගා ගනියි. | 8.3 පාලනය - ආර්ථිකය හා සදාචාරය අතර අන්‍යෝන්‍ය සම්බන්ධය හදාරයි.<br>9.1 චින්තනය සහ විමංසනය පිළිබඳ බෞද්ධ ආකල්ප ප්‍රගුණ කරයි.<br>9.2 වගකීමෙන් යුතුව නිවැරදි තීරණ ගනියි.<br>9.3 ආරම්භක ශක්තියෙන් හා නිර්මාණශීලිත්වයෙ යුතුව උද්යෝගයෙන් ක්‍රියා කරයි.<br>9.4 ඉවසා දරා ගැනීමේ ශක්තියෙන් යුතු ලෝකස්වභාවයට මුහුණ දෙයි. | | දෙකයි |
| | 9.5 වැරදි බහුල සමාජයක නිවැරදි ජීවිතය ගොඩනගා ගැනීමට පෙළඹේ. | 10.1 සැදැහැවතාගේ ලක්ෂණ (දස්සනකාමෝ සීලවතං) | දෙකයි |
| 10 නිර්වානය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 10.1 බෞද්ධ ජීවිතය ශ්‍රද්ධාවෙන් ආරම්භ වන බ දැන සැදැහැතිව ක්‍රියා කරයි.<br>10.2 නිවැරදි දැක්මක් ඇතිව කායික මානසි ක්‍රියාවන්හි යෙදෙයි.<br>10.3 නිවන් අරමුණේ වැදගත්කම තේරුම් ගෙ බෞද්ධ ප්‍රතිපදාවේ නියැලෙයි. | | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.